# HDCI 2017 – Assignment(s) of Fourth Semester

**අපරාධ විමර්ශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2017 හි සිව්වන සෙමෙස්තරයේ නිබන්දන**

උපදෙස්

- ❖ 2019.02.15 දින සිට 2019.04.28 දක්වා සති 10 ට ආසන්න කාලයක් ක්ෂේත්‍ර පුහුණුව සඳහා ශික්ෂණ පොලිස් ස්ථාන වලට අනුයුක්ත කරනු ලබයි.
- ❖ එම කාලය තුලදී **අපරාධ විමර්ශන අංශය, ළමා හා කාන්තා අපරාධ විමර්ශන අංශය, විවිධ පැමිණිලි විමර්ශන අංශය** යන අංශ වලට අනුයුක්තව පුහුණුව ලැබිය යුතුය. (පැවරුම් වලට අදාල අංශ)
- ❖ විශේෂයෙන් අපරාධ විමර්ශන අංශය, ළමා හා කාන්තා අපරාධ විමර්ශන අංශය, විවිධ පැමිණිලි විමර්ශන අංශය යන අංශ වල සති තුන බැගින්වත් අනුයුක්තව පුහුණුව ලැබීම නිර්දේශ කරනු ලබයි.
- ❖ පුහුණුව ලබන කාලය තුලදී පහත සඳහන් නිබන්දන සහ ඉදිරිපත් කිරීම් සම්පූර්ණ කල යුතුය.
- ❖ විභාග අක්‍රමිකතා සිදුකර තිබීම ප්‍රතිඵල අත්හිටුවීමට හේතු වන අතරම විනයානුකූලව කටයුතු කිරීමටද හේතු වේ.
- ❖ **2019.04.26 දින පැය 1600** ට ප්‍රථම පහත ආකාරයට සම්පූර්ණ කරන ලද නිබන්දන / පැවරුම් විද්‍යුත් තැපැල් මගින් යොමු කළ හැකිය. එසේ නැතහොත් මුද්‍රිත පිටපත් රාගම වෛද්‍යපීඨයේ විභාග අංශයට බාරදිය යුතුය. විද්‍යුත් තැපැල් මගින් යොමු කිරීම හෝ මුද්‍රිත පිටපත් බාරදීම නිසි ලෙස බාරදුන් ලෙස සලකනු ලබයි. කෙසේ වුවද විද්‍යුත් තැපැල් මගින් යොමු කරන ලද නිබන්දන වල **මුද්‍රිත පිටපත්,** ඉදිරිපත් කිරීම ඇගයීම් (viva presentation assessment) ආරම්භ කරන දින පැය 0900 ට ප්‍රථමව රාගම වෛද්‍යපීඨයේ විභාග අංශයට බාරදිය යුතුය.
- ❖ ස්වයං ප්‍රකාශ (Declaration form) නිසි ආකෘතිය අනුව සම්පූර්ණ කර නිබන්ධනවල / පැවරුම්වල ගොනුකර තිබිය යුතුය.
- ❖ නිබන්ධන / පැවරුම් සියල්ලක්ම Times New Roman, FMAbhaya, AHNelum, Iskoola Pota යන අකුරු වර්ග බාවිතයෙන් පමණක් සකස් කල යුතුය. Font Size – 12, Line Space – 1.5 විය යුතුය. ප්‍රධාන මාතෘකා Font Size – 16 සහ අනු මාතෘකා Font Size – 14 බාවිතා කල යුතුය.

All assignments should be hands over either as a **hard copy to the Exam unit, Faculty of Medicine, University of Kelaniya** or as an **e-copy mail** to **hdciexam@kln.ac.lk** address on or before **26th April 2019, 4.00 pm**. (e-copy should be in pdf format)

The filled **declaration form should be attached to both copies**. Please use scanned copy of filled form to attach to e-copy. Delayed submissions will be subjected to mark reduction as in students' hand book.

Both copies (hard copy and e-copy) should be submitted before the viva presentations.

Please note that plagiarism in any form is an examination offence.

**පාඨමාලාවේ සිව්වන සෙමෙස්තරයට අදාලව පහත පරිදි නිබන්ධන සහ ඉදිරිපත් කිරීම් පවතී.**

## 01. Fundamental Principles of Crime Investigation – 2 - HDCI 22144

ASSIGNMENT - නිබන්ධය

- An essay of about **1500** words based on a topic covered by the Unit Outcomes
- අපරාධ විමර්ශන ක්‍රියාවලියේදී, අපරාධ තොරතුරු වාර්තා කිරීම (උදා - අපරාධ ගොනු, විශේෂ අපරාධ වාර්තා, බල අපරාධ සාරාංශය ආදිය) විමර්ශන ක්‍රියාවලියට අදාල නෛතික රාමුවට නොවැටෙන නමුත් අපරාධ පරිපාලනයේදී ඉතා වැදගත් කාර්යබාරයක් ඉටු කරයි. අපරාධ විමර්ශන ක්‍රියාවලියේදී, අපරාධ තොරතුරු වාර්තා කිරීම (උදා - අපරාධ ගොනු, විශේෂ අපරාධ වාර්තා, බල අපරාධ සාරාංශ) මගින් අපරාධ වැළක්වීමෙහිලා ගත හැකි ප්‍රයෝජන කවරේදැයි වචන 1500 ක විශ්ලේෂණාත්මකව වාර්තාවක් ඉදිරිපත් කරන්න. අපරාධ ගොනු, විශේෂ අපරාධ වාර්තා, බල අපරාධ සාරාංශය ආදිය ඇසුරු කරමින් ඔබගේ වාර්තාව සනාථ කල යුතුය.

PRESENTATION - ඉදිරිපත් කිරීම

- 10 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක්

## 02. Crime profiling for crime investigation - HDCI 22153

ASSIGNMENT - නිබන්ධය

- An essay of about 1,500 words based on a topic covered by the Unit Outcomes
- 1500 word report on crime profiling in respective area (Division / ASP District / Station) with the new knowledge certified by the supervisor
- මනුෂ්‍ය ඝාතන හෝ ස්ත්‍රී දූෂණ අපරාධ දෙකක් හෝ තුනක් ප්‍රොෆයිල් කිරීමේ ලක්ෂණ හඳුනාගෙන වචන 1500ක වාර්තාවක් පිළියෙළ කරන්න. ප්‍රොෆයිල් කිරීමේ ලක්ෂණ සම්බන්ධව ඔබගේ අදහස් සහ යෝජනා විස්තර කරන්න. ඔබගේ වාර්තාවට පදනම් කරගත් අපරාධ සිද්ධි වල අපරාධ වාර්තාවේ - crime file (සාරාංශ වාර්තාව පමණි, ගොනුවේ සියලු සටහන් අවශ්‍ය නොවේ) උද්‍ධෘත පැවරුම සමග ගොනු කර ඉදිරිපත් කල යුතුය. ඔබ තෝරා ගන්නා අපරාධ 2017.01.01 දිනට පසු වාර්තා වූ අපරාධ විය යුතුය, වෙනත් පැවරුමකට තෝරාගන්නා ලද අපරාධ නොවිය යුතුය.

PRESENTATION - ඉදිරිපත් කිරීම

- 10 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක්

## 03. Criminal Intelligence Surveillance for Investigation - HDCI 22164

ASSIGNMENT - නිබන්ධය

- An essay of about 1,500 words based on a topic covered by the Unit Outcomes
- **15**00 word report on application of criminal intelligence for two different types of unsolved cases

- අපරාධ විමර්ශන අංශයෙහි, ළමා හා කාන්තා අපරාධ විමර්ශන අංශයේ, කොට්ටාශ විශේෂ අපරාධ විමර්ශන අංශයේ වාර්තා වූ බල අපරාධ දෙකක් සම්බන්ධයෙන් ඔබ ලබාගත් දැනුම ආශ්‍රයෙන් පැවරුම සිදුකළ යුතුය. මෙම පැවරුමේ දී අපරාධ බුද්ධි ක්‍රියාවලිය යොදාගෙන, තොරතුරු, තොරතුරු සම්පාදනය කිරීම, ආවේක්ෂණ ක්‍රම, ආවේක්ෂණය කිරීම, විශ්ලේෂණය කිරීම, ආදී න්‍යායාත්මක ක්‍රම, ඉහත කී අංශවල **නොවිසඳුනු අපරාධ දෙකක්** සම්බන්ධයෙන් ප්‍රයෝගිකව ක්‍රියාත්මක කර, එහි සාර්ථක අසාර්ථක බව ගැන වචන 1500 ක විමර්ශනාත්මක විග්‍රහයක් සිදුකල යුතුය. ඔබ තෝරාගන්නා ඉහත කී **අපරාධ දෙක එකිනෙකට වෙනස් අපරාධ දෙකක්** විය යුතුය. ඔබගේ පැවරුම සමග අදාල අපරාධ දෙකෙහි අපරාධ වාර්තාවේ - crime file (පළමු සාරාංශ වාර්තාව පමණි, ගොනුවේ සියලු සටහන් අවශ්‍ය නොවේ) උද්‍ධෘත පැවරුම සමග ගොනු කර ඉදිරිපත් කල යුතුය. ඔබ තෝරා ගන්නා අපරාධ 2018.01.01 – 2018.12.31 කාලය තුලදී වාර්තා වූ අපරාධ විය යුතුය, වෙනත් පැවරුමකට තෝරාගන්නා ලද අපරාධ නොවිය යුතුය.

<u>PRESENTATION - ඉදිරිපත් කිරීම</u>

- 10 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක්

## 04. <u>Disaster Management & Disaster Victim Identification - HDCI 22172</u>

<u>ASSIGNMENT - නිබන්ධය</u>

- An essay of about 1,500 words based on a topic covered by the Unit Outcomes

- <u>ආපදා කළමනාකරණය (Disaster Management)</u>
  මෙම කොටසේ පැවරුම "ආපදා කළමනාකරණය" මාතෘකාව යටතේ වෙනම ඉදිරිපත් කල යුතුය.

- තම පොලිස් බල ප්‍රදේශයේ සිදුවන ප්‍රධාන අපදා හඳුනාගෙන එම අපදා කලමනාකරණය කරන ආකාරය පිළිබඳව ඒකාබද්ධ අපදා කලමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කලයුතුය. ඔබගේ සැලැස්ම වචන 1500ට නොඅඩු විය යුතු අතර, කළමනාකරණය කළ යුතු ආපදාවන්, ආපදා කළමනාකරණයේ දී සහ ආපදා අවදානම් කළමණාකරණයේ දී පොලිස් නිලධාරීන්ගේ කාර්යභාරය හඳුනා ගැනීම, කුසලතාවයන් හඳුනා ගැනීම හා ආදර්ශනය කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය.

- <u>PRESENTATION - ඉදිරිපත් කිරීම - නැත</u>

<u>ආපදා වින්දිතයන් හඳුනා ගැනීම (Disaster Victim Identification)</u>

මෙම කොටසේ පැවරුම "ආපදා වින්දිතයන් හඳුනා ගැනීම" මාතෘකාව යටතේ වෙනම ඉදිරිපත් කල යුතුය.

1. ඔබ සිව්වන සෙමෙස්තරයේ ක්ෂේත්‍ර පුහුණු කාලය තුලදී වාර්තාවන මනුෂ්‍ය ඝාතනය, සිය දිවි නසා ගැනීම හෝ වෙනත් ආකාරයක මෘතදේහයක් සම්බන්ධව අපරාධ වින්දිතයන් හඳුනා ගැනීමට අදාලව පෝරමය සම්පුර්ණ කර ඉදිරිපත් කිරීම. මෙම පෝරමය සමග ඔබ තෝරාගත් සිද්ධිය සම්බන්ධව තොරතුරු පොත් සටහන් උද්‍ධෘත ඉදිරිපත් කල යුතුය.
2. පොලිස් ස්ථානයට වාර්තා වී ඇති අතුරුදහන් වූවකු පිළිබඳව පසුගිය වාර්තා අධ්‍යයනය කර, එයට අදාලව පෝරමය සම්පුර්ණ කර ඉදිරිපත් කිරීම. මෙම පෝරමය සමග අතුරුදහන් වූ අය පිළිබඳව තොරතුරු පොත් සටහන් උද්‍ධෘත ඉදිරිපත් කල යුතුය.

<u>PRESENTATION - ඉදිරිපත් කිරීම - නැත</u>

## 05. <u>Fundamental Rights & Victim's Rights of Crime Investigation - HDCI 22182</u>

<u>ASSIGNMENT - නිබන්ධය</u>

- An essay of about 1,500 words based on a topic covered by the Unit Outcomes
- A 1500 word reflective note on where fundamental rights/ victims' rights were suspected certified by in-service supervisor
- **පොලිස් විමර්ශන වලදී** අපරාධ වින්දිත අයිතිවාසිකම් කඩ වූ අවස්ථාවක් / අපරාධ සාක්ෂිකරුවන් ආරක්ෂා නොවූ අවස්ථාවක් / අවස්ථාවන් පිළිබඳව සිද්ධි අධ්‍යයනය කර, එලෙස කඩවීමට හේතු, ඒ සම්බන්ධයෙන් ගත යුතු පිළියම්, කඩ නොකිරීමට ගතයුතු ප්‍රතිකර්ම පිළිබඳව වචන 1500 ට නොඅඩු විමර්ශනාත්මක වාර්තාවක් සත්‍ය සිදුවීමක් ඇසුරෙන් සකස් කල යුතුය. ඔබගේ පැවරුම සමග අදාල සිද්ධිය සනාථ කිරීමට අවශ්‍යවන ලේකන (පැමිණිල්ල / වාර්තා / නඩු තීන්දු, ආදිය) ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍යය වේ.

<u>PRESENTATION - ඉදිරිපත් කිරීම</u>

- 10 min presentation based on your assignment
- ඔබගේ නිබන්ධය ආශ්‍රයෙන් විනාඩි 10 ක ඉදිරිපත් කිරීමක්

**Date – 15th February 2019**

---